




සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"කවිය වූ කලී හරස් පද ප්‍රහේලිකාවක් නොවේ. කවියේ රුව ගුණ, සම්මත මිනුම් දඬු මතම තක්සේරු කළ හැකිද නොවේ." මේ, කවිය පිළිබඳ ප්‍රවීණ ලේඛකයකුගේ ප්‍රකාශයෙක් නොවේ. එහෙත් නිර්මාණ කාරණයෙහිලා සිය කුසලතාව ප්‍රකට කර ඇති තරුණ ලේඛකයකු මීට සිව් වසරකට පෙර ප්‍රකාශයට පත් කළ සිය ප්‍රථම කාව්‍ය කෘතියෙහි යොදා ඇති සටහනෙහි ඇතුළත් වන්නකි. කවියකින් රසිකයාට හඳුනාගන්නට ලැබෙන අරුත, එමගින් විඳගන්නට ලැබෙන ආස්වාදය මෙන්ම එයින් මතු වන සමාජ නිරීක්ෂණය ද එම කවියේ සැබෑ රුව ගුණ ප්‍රකට කරවයි.

සාහිත්‍යය, නැතහොත් විශේෂයෙන් සලකා බලන විට කවිය, මූලික වශයෙන් සහෘදයාගේ රස වින්දනය අරමුණු කොට ගෙන නිර්මාණය වෙයි. "කාව්‍යං රසාත්මකං වාක්‍යං" යනුවෙන් දැක්වෙන්නේ ද " කාව්‍යය, පුළුල් වශයෙන් ගත් කල සාහිත්‍යය, රසය ආත්ම කොට ගත්තක්ය" යන මතය පාදක කරගනිමිනි. කාලයාගේ ඇවෑමෙන් සමාජය හා ඊට ඇතුළත් සියළු දේවල ක්‍රමික විපර්යාස සිදු වන්නා සේම කවිය ගැන, පොදුවේ ගත් විට සාහිත්‍යය ගැන පළ වී ඇති මතවාද වලද වෙනස්කම් දක්නට ඇත.

# කවියක අරුතෙන් මතුවන සමාජ යථාර්ථය

සාහිත්‍ය වූ කලී සමාජය පිළිබිඹු කරන කැඩපතක් :බසඑැර්එමරු සි" පසරරදර දශ්දප්සැඑහ* බව අද පිළිගැනෙන්නේ ද මේ අනුවය.

සාහිත්‍ය හැදෑරීමේදී එහි කාව්‍යමය ගුණය ඇතුළු ලක්ෂණ කෙරෙහි දක්වන අවධානයට අමතරව එමගින් සමාජය පිළිබිඹු වන ආකාරය නිරීක්ෂණය කිරීම ද වර්තමාන සාහිත්‍ය විචාරකයන්ගේ කාර්යභාරය වී ඇත. නවකතා, කෙටිකතා, නාට්‍ය, චිත්‍රපට ආදී කලා මාධ්‍ය මෙන්ම කාව්‍ය නිර්මාණ මගින්ද ලේඛකයන් සමාජ විවරණයට යොමු වී ඇති ආකාරය දැකගත හැකිය.

මෙය වූ කලී එදා කවිය මගින් සිදු වූවාටත් වඩා නූතන කාව්‍ය නිර්මාණ ඇසුරෙන් වැඩි වශයෙන් සිදුවන ආකාරය දැකගත හැකිය. ඉහතින් සඳහන් කළ කාව්‍ය කෘතිය, පමිත ආර්. ලියනගේ නම් තරුණ ලේඛකයකුගේ "ආදරය සහ සඳ එළිය" නම් නිර්මාණ සංග්‍රහයයි. එහි අන්තර්ගත තරමක් දීර්ඝ වූත්, බොහෝ විට ඉතා කෙටි වූත් පද්‍ය මෙම ලේඛකයාගේ සමාජ නිරීක්ෂණ ශක්තිය කියා පාන ඒවාය.

***<u>කවියක හෝ වෙනත් කවර නිර්මාණයක හෝ ඇතුළත ගැබ් වූ යථාර්ථය රසිකයා විසින් හාරා අවුස්සා, විග්‍රහයට ලක් කොට හඳුනාගනු ලැබීම අවශ්‍ය වෙයි.</u>***

විශ්වවිද්‍යාල ශිෂ්‍ය පිරිසක් උදෙසා පැවැත්වුණ දේශනයකදී ඉදිරිපත් කළ කරුණක් සනාථ කිරීම සඳහා උක්ත කාව්‍ය කෘතියෙහි ඇතුළත් කෙටි කවක් නිදර්ශනයක් ලෙස ගෙන හැර දැක්වීමට මට අවස්ථාව ලැබිණ. ඒ වනවිට සාවධානව දේශනයට සවන් දී සිටි සිසු පිරිස මා උපුටා දැක්වූ කෙටි කවිය අසා පළමුව සිනාසීමටත් දෙවනුව දැඩි සේ කල්පනාවේ නිමග්න වීමටත් යොමු වූ ආකාරය දැනුදු මගේ මතකයට නැගෙයි.

එම කෙටි කව මෙසේය:

"ගමේ හොල්මන්
නොදුටු මේ මං
මෙහේ හොල්මන්
දැකල හොල්මන්"

(ආදරය සහ සඳ එළිය - 12 පිට)

මෙම නවක ලේඛකයා මෙවැනි කෙටි නිර්මාණයකින් පාඨක අපට කියා දෙන්නේ සමාජ යථාර්ථයයි. " කොළඹ සහ මම" යනුවෙන් නම් කර ඇති, පද හතරකින් සමන්විත මෙම කවියෙහි කතුවරයා දකින සමාජ ස්තර දෙකකි, යුග දෙකකි. චරිත ලක්ෂණ හා හැසිරීම අතින්ද දෙවැදෑරුම් පසුබිම් මෙහි ප්‍රතිමාන වෙයි. නිර්මාණ කරුවකු සැබවින්ම සිය කෘතීන් සඳහා පාදක කරගන්නේ තමන් අවට සමාජයයි. ඒ තුළ තමන් දින හා අත්විඳින දේ කවරාකාරයකින් හෝ ඔහුගේ රචනා තුළ කුළු ගැන්වෙයි.

උක්ත පද්‍යය ගැන විග්‍රහයක් කර බලන විට මෙහි ප්‍රධාන කරුණු කිහිපයකි. "හොල්මන්" යන සංකල්පය ඉන් එකකි. කතුවරයා එය විවිධ අරුත් පළ වන සේ යොදා ගනිමින් සමාජ යථාර්ථය එමගින් පිළිබිඹු කරයි. "ගම" හා "නගරය" නැතහොත් "කොළඹ" තවත් දෙවැදෑරුම් පසුබිම් දෙකකි. වෙනත් විදියකින් දක්වතොත් "ගම" හා " සිදාදිය" ලෙස මේවා දැක්විය හැකිය. මේ අයුරින්, " හෝලමන්", "ගම", "නගරය" යන තුන් ආකාර කාරණා එක් වන හා ඊට මැදි වන "මම", නැතහොත් කථකයා කේන්ද්‍ර ස්ථානගත වී ඇත.

පමිත ලියනගේ තරුණ නිර්මාණ කරුවා මෙම කෙටි කව මගින් මතු කරන අරුත පුළුල්ය, විශාලය. එමෙන්ම සංකීර්ණය. ඒ ගැන සිතා බලන සහෘදයාට තම අත්දැකීම් ද ඊට මුසු කර ගනිමින් සිතන්නට ඇති දේ බොහෝය. එමගින් දෙන අර්ථකථනද විවිධාකාරය. "ගම" හා සම්බන්ධ "හොල්මන්" යන සංකල්පය, ගැමි පරිසරයක හැදෙන වැඩෙන කා හට වුවද නුහුරු, නුපුරුදු වූවක් නොවේ. බාල වියේදී අප සොහොන් බිමක් පසු කරගෙන යද්දී, විශේෂයෙන්ම ගොම්මං වෙලාවේ එසේ යතහොත් " හොල්මන්" දුටුවා හෝ නුදුටුවා හෝ ඒ ගැන සිතා බිය වැදුණෙමු. අඩ අඳුරේ ගසක අත්තක්, වියළුණ වැලක් නැතහොත් වෙනත් දෙයක් සුළගට සෙලවෙනු දකින අපි ඒ "හොල්මන්" යයි සිතා බිය වීමු. කෙනෙකු මිය ගිය පසු එම නිවස තුළ කවර හෝ හේතුවක් නිසා හඬක් නැගුණ හොත් අපට සිතුණේ ඒ හොල්මන් කියාය.

එවන් ගැමි පරිසරයක හැදුණු වැඩුණ කෙනෙකු යම් ආකාරයකින් දැනුමෙන්, බුද්ධියෙන් සිතා බලා එවැනි දේ සැබවින්ම නොමැති බව තරයේ සිතා ගන්නා අවස්ථා ඇත. විශේෂයෙන්ම විද්‍යාව හා තාක්ෂණය දියුණු වී ඇති වර්තමානයේ ගම්බද දරුවන් එවැනි අදහස් සමච්චලයෙන් යුතුව සලකා ඉවත් කරන්නට යොමු වීම අනපේක්ෂිත වූවක් නොවේ. උක්ත නිර්මාණයෙහි කථකයා ගමට පුරුදු හොල්මන් කිසිදාක දැක නැතත් නගරයට අවුත් එහි ජීවත් වීමේදී ඔහුගේ ඇස ගැසෙන දේ සැබෑ හෝලමන් ලෙස අර්ථ කථනය කරයි.

මෙහිදී හොල්මන් යන්න වඩා පුළුල් අරුතකින් ගෙන ඇත. ඇතැම් විට විකාර රූපී දර්ශනයක් හෝ පුද්ගලයෙකු ඇස ගැසුණු විටදී, "මහ හොල්මනක්", "නරලොව හොල්මන්" යනාදී යෙදුම්වලින් එවැනි දර්ශන හෙළා දැකීමට කෙනෙකු යොමුවන්නට ඉඩ ඇත. ලියනගේ කවියා මෙහි දක්වන්නේ දෙවනුව කී අරුතයි. ගමේදී නුදුටු හොල්මන් අමුතු ආකාරයකින් නගරයේදී දකින විට තමන්ට සිදුවන මානසික චංචල භාවය ඔහු අවසාන පදයෙන් කියා පායි. " දැකල හොල්මන්" යන එම යෙදුම ද කියවන්නාට තේරුම් ගැනීම අපහසු නොවේ. "මේව දැකල මං හොල්මන් වුනා" යි කෙනෙකු පැවසුවහොත් ඉන් හැගෙන්නේ ද සිත කලබල වූ බවකි, වික්ෂිප්ත වූ බවකි. එසේ නම් ගමේදී "හොල්මන්" ලෙස සැලකෙන අදෘශ්‍යමාන, ගුප්ත බලවේග හෝ දර්ශන නවීන දැනුම මගින් ප්‍රතික්ෂේප කරන්නකුට නගරයට, විශේෂයෙන්ම කොළඹට ආ විට දකින්නට ලැබෙන "විසූක දස්සන" (හොල්මන්) යන විකාර රූපී දේ නිසා පුදුමයට පත් වීම ස්වාභාවිකය.

කවියක හෝ වෙනත් කවර නිර්මාණයක හෝ ඇතුළත ගැබ් වූ යථාර්ථය රසිකයා විසින් හාරා අවුස්සා, විග්‍රහයට ලක් කොට හඳුනාගනු ලැබීම අවශ්‍ය වෙයි. මේ අයුරින් විමසා බලන විට උක්ත කවියා ගම හා නගරය (කොළඹ) අතර ඇති සමාජීය වෙනස පිළිබඳ කිසියම් වේදනාත්මක හැඟීමක්ද පළ කරන බව පෙනේ. නගරය තුළ ජීවත් වන්නන්, විශේෂයෙන්ම තරුණ පිරිස, සිය සිතුවිලි හෝ ක්‍රියාදාමයන් පාලනයකින් තොරව, අසංවර හැසිරීම් රටාවකින් යුක්තව පෙන්නුම් කිරීම කවියා දකින්නේ --- අනුකම්පාවකිනි. කවියකු හෝ අන් කවර ලේඛකයකු හෝ වෙතින් අප අපේක්ෂා කරන්නේ ද එවැනි සංවේදී බවක් සමග --- අනුකම්පාවෙන් යුතු ආකල්පයකි. වර්තමාන ශ්‍රී ලංකාව තුළ නගරබඳව ජීවත් වන ඇතැම් පුද්ගලයන්ගේ ඇවතුම් පැවතුම්, කතාබහ, විලාසිතා යනාදිය සැබෑ "හොල්මන්" ලෙස ඔවුන් දර්ශනය වීමට හේතුවන බව මෙම කවියාගේ ආකල්පයයි. එවන් දසුන් දකින තම සිත ද වික්ෂිප්ත තත්වයකට ව්‍යාකූල ස්වාභාවයකට පත් වීම මෙම කවියෙන් මතු කෙරෙන යථාර්ථයයි. එගින් කවියා සමාජයට දෙන පණිවුඩයක් ඇත. ගැමි ජනයා විශ්වාස කළ "හොල්මන්" වූ කලී මිත්‍යා විශ්වාස අනුව, ඔවුනගේ දැනුම් මට්ටම අනුව පැවති දේය. බුද්ධිමත් තරුණයකු ඒවා විශ්වාස කිරීමට නොපෙලඹීම අපෙක්ෂා කළ හැක්කෙකි. එවන් මිනිසුන් පුදුමයට පත් කරවන තරම් සමාජ විපර්යාසයක් අද සිදු වී ඇති බව පවසන කවියා සමාජය එසේ නොවිය යුතුය යන්න අපට ඉඟියෙන් පවසයි.

අද තරුණ කවි කිවිඳියන්ට සිය නිර්මාණවලදී "සඳ" වස්තු විෂය වන අවස්ථා, ඔවුන් එය තේමාකොට ගත් අවස්ථා විරල නොවේ. "සඳ මත වීතරාගය" නිරන්ජන් ගුරුගේ නම් තරුණ නිර්මාණ කරුවාගේ තුන් වන කෘතියයි.



"මාහාමායා දේවී
විළිරුදා විඳින සඳ
නැමුණු සල් අතු උඩින්
බලා සිටි සඳ

වනස්පති ඇසතු මුල
බද්ධ පර්යංකයෙන්
සිදුහතුන් සිටින සඳ
බලා සිටි සඳ.........."

"ලෝකය වෙනස් වෙන සඳ
නොවෙනස්ව ඉන්නද සඳ
සඳ රැස් මවන්නට
විඳිනවද සඳ මොන වද"

(සඳ මත වීතරාගය - 50, 51 පිටු)

මුලින් දැක් වූ කෙටි කවියෙහි "හොල්මන්" එක් අතකින් සමාජ විපර්යාසය සංකේතවත් කිරීම සඳහා යොදා ගන්නා සේම මෙම පද්‍ය පන්තියෙහි "සඳ" තේමා කොටගෙන ඇත්තේ වෙනස් වන ලෝකයෙහි නොවෙනස්ව ඉඳිමින් සඳ තවදුරටත් පෙර පරිද සඳ රැස් මවන්නට වද විඳින ආකාරය දක්වමින් සමාජ විපර්යාසය යන්න තවත් කෝණයකින් රසික සිත් තුළට දැන්වීම උදෙසාය. ලෝකය තුළ එදා මෙදාතුර සිදු වෙමින් යන වෙනස් වීම් අනන්තය, අප්‍රමාණය. ඒ සියළු වෙනස්කම් දකිමින්, වද විඳිමින් සිදුවන සියල්ල විඳ දරා ගනිමින් තවමත් පෙර සේම පායන සඳ කවියා සංකේතවත් කොට ගන්නේ වෙනස් වන ලෝකය තුළ නොවෙනස්ව සිටීමට, ඉමහත් ප්‍රයත්නයක් දැරිය යුතු නොවේද යන පැනයට මතු කරමිනි.

වත්මන් ලෝකය වෙනස් වෙමින් යන්නේ හෙමින් නොවේ. එකී ගමන ශීඝ්‍රගාමී වූවකි. ඒ අතර හඳුන්වා දෙනු ලැබ ඇති තාක්ෂණික මෙවලම්, අන්‍යොන්‍ය සම්බන්ධතා ද වෙනස් කරමින් ඇත. ශ්‍රී ලංකාව වැනි රටක වුවද මෙම ශීඝ්‍ර විපර්යාසය සිදු වෙමින් පවතින ආකාරය තවත් ආධුනික නිර්මාණයිකින් පළ වී ඇත්තේ මෙසේය.

"එදවස රජ දරුවෝ
සග සසුනට වැඩ තකා
කළහ පූජා
අගත අනගත චතුදිස සගස"
සෙල්ලිපිවල සටහන් කරමින්"

අද යොවන යොවනියෝ
තර කරගනිති පෙම් සබඳතා
අතොරක් නැතිව හුවමාරු කරගනිමින්
"සෙල්" ලිපි
දුනු හීයෙන් යුද වැදුණ
ඔවුහු යැවූහ පණිවුඩ
රහස් ඔත්තු ඈ දේ
"ඊ මේල්" ලෙසින්

දියුණුය තාක්ෂණය, අද
වේගවත්ය සන්නිවේදනය
සියළු යහ අයහ දෑ කෙරෙයි
"ඊ මේල්" මගින්
යස අගේට!

("සෙල්ලිපි" සහ "ඊමේල්" - අප්‍රකාශිත රචනාවකි)

39 වන පිටට